# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 414/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 09/03/2024<br>පැය 1550 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.03.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 04 | 95 | 1800 | යතුරුපැදි 01<br>යකඩ බැරල් 01<br>තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර**

2024.03.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කිරිඳිවැල පොලිස් වසමේ හද්දුව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර කැළණි ගං ඉවුර ඛාදනය වන ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු ගැරුම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21ත් 58ත් අතර වයස් වල පසුවන මීතිරිගල සහ කොස්ගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2024.03.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තිරුක්කෝවිල් පොලිස් වසමේ උඩුම්බිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 48ක් වූ තිරුක්කෝවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. බලපත්‍ර නොමැතිව වැලි ගබඩාවක් පවත්වාගෙන ගිය සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර

2024.03.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මංගලගම පොලිස් වසමේ 26 කණුව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි ගබඩාවක් පවත්වාගෙන ගිය සැකකරුවකු අත්අඩංගුවට ගෙන මංගලගම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 24ක් වන අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**
මංගලගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. නීති විරෝධි මත් පෙති සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.

2024.03.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ ඕඑල්ආර් පල්ලිය අසල සහ නල්ලූර් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පෙති 300ක්, ගංජා ග්‍රෑම් 500ක් සමඟ ජංගම දුරකථනයක් සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 22ක් හා 42ක් වන නල්ලූර් හා යාපනය** ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**